
# කඩුපුල් මල් කුමාරි



ඉසුරින්දි ද අල්විස්.

පොතේ නම - කඩුපුල් මල් කුමාරි

කර්තෘ - ඉසුරින්දි ද අල්විස්

ISBN - 978-624-206-805-3

කෘතිය පළ කරන දිනය -15.11.20

කර්තෘගේ වෙනත් කෘති -

- මගේ යාළුවා
- රීලා කතා
- THE MEETING

# පිදුම

මෙම මහඟු කාර්යය  සඳහා මා දිරිමත් කල මාගේ ආදරණීය ගුරුමහත්මිය සමන්මලී ගුරුතුමියටත්, මගේ පවුලේ අයටත් මෙය පුද කරමි.

## පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 . 11 . 01

අම්මේ.. අනේ එන්නකෝ.

ඇයි පුතේ කෑගහන්නේ?

මේ බලන්න මගේ කඩුපුල් වැලේ චූටි කැකුළක් ඇවිල්ලා.

අනේ ඇත්තමයි.

මේ මල ලස්සනට පිපේවී.

මේ අම්මාගේ හා දුවගේ කතාව මම ගැනයි.



මම මේ ලෝකේ ලස්සන බලන්න ආව නාග ලොවේ රැජින කඩුපුල් මල් කුමාරියි.

ලා රෝස පාට කඩුපුල් පැලේ දිග කොල අතරින් මම මේ ලෝකය දිහා බලනවා. මේ මගේ ගෙදර අවට ලස්සනයි. පිරිසිදුයි.

ඒත් එහා ගෙදර වැට අයිනේ ප්ලාස්ටික් කෑලි ගොඩ ගැහිලා හරිම කැතයි.

'අම්මේ ඉස්කෝලේ යන්න පරක්කු වෙනවා මම යනවා.'

චූටි ගියා මට තනියි. පාළුයි.

පාසැල ඇරිලා ඇවිත් ආයෙත් එයා මා ළඟට එයි මේ ළමයා ගස් වැල් වලට මල් වලට පරිසරයට ආදරෙයි.

එදා හවසත් එයා මා ළඟට ආවා. මාව හිමිහිට අතගෑවා.

'අනේ රෝස පාට ලස්සනයි.'

පහුවෙනිදත් ආවා. 'අනේ මෙයා දැන් ටිකක් ලොකුයි.' එයා මා ගැනම කතා කරනවා.

මෙහෙම දවස් හතරක් ගියා.

චූටි දූයි එයාගේ මල්ලියි නිවාඩු වෙලාවට මා ළඟමයි. හරිම ආදරෙයි.

අනේ මටත් මගේ ලෝකෙට යන්න කාලය ලං වෙලා ලස්සනට හැඳ පායාගෙන එනවා.

මේ ගෙදර පවුලේ අය හැමෝම මා ළඟ.

චූටි දූ අෑ නම් මලක් වගෙයි.

'ඔව්, අම්මේ මම කඩුපුල් මල පිපෙනකන් ඇහැරගෙන ඉන්නවා.' වෙලාව රෑ දොළහයි.

මම සෙමෙන් පෙති විදහා බැලුවා. මගේ සුවඳ මේ රාත්‍රියේ මුළු පරිසරය පුරා පැතිරුණා.

චුටි දූ කෑගසනවා අනේ මල පිපුණා. හරිම ලස්සනයි. පෙති සුදු පාටයි. හරියට කුමාරියක් වාගෙයි.

අම්මේ අපි හෙට මේ මල බුදු සාදුට පූජා කරමු.

දුවගේ හඬට මගේ අතින් පිනි කඳුලක් වැටුනා.

අනේ චුටි බබෝ ඔයා හෙට අවදි වෙනකොට මම මගේ ලෝකයට ගිහින්.

ඒත් මම ඔයා බලන්න ආයෙත් මේ ලෝකෙට දවසක එනවා.

ඔයා වගේ පරිසරයට ආදරය කරන ළමයි සිටින තුරු මේ ලෝකය ලස්සන වේවි.





## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හිස්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01

ISBN- 978-624-206-805-3